## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා යලි පණ ගැන්වීම සඳහා යෝජනාවක්

සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය, ජූනි 22, 2022

https://sadharana.org/2022/06/a-proposal-for-revitalizing-sectoral-oversight-committees-in-the-9th-parliament-of-sri-lanka/

රට පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අතර එම අර්බුදය වත්මන් 9 වැනි පාර්ලිමේන්තුවේ ධුර කාලය ඉක්මවා ඉන් ඔබ්බට යනු ඇත. එවැනි තත්වයක් යටතේ අප විසින් අපට සුපුරුදු ලෙස නොව නුපුරුදු අළුත්ම මාර්ගයන් ඔස්සේ රට ගොඩ ගැනීමට ක්‍රියාත්මක විය යුතුව ඇත.

වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විශේෂයෙන්ම තරුණ කැබිනට් නොවන මන්ත්‍රීවරුන්, තමන්ටද මෙලෙස රට ගොඩ ගැනීමට දායක වීමට වීමට මං පෙත් සොයමින් සිටිති. එක් විසඳුමක් ලෙස පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා යළි පණ ගැන්වීම සඳහා ඉල්ලුමක් පවතී.

එබැවින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 ප්‍රකාරව - කථානායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, සභානායක, විපක්ෂ නායක, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරු හා අගමැති හැර - පාර්ලිමේන්තුවේ පූර්ණ සාමාජිකත්වය ඒකරාශී කර ගනිමින් පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා (Sectoral Oversight committees) වහාම ක්‍රියාත්මක කිරීමට රජය යෝජනා කරයි.

මෙහිදී අදාළ විෂයයන් සහ දෙපාර්තමේන්තු සහ ආයතනවල සම්පූර්ණ පරාසය ආවරණය වන පරිදි පෙර තිබූ ලෙස ආංශික කාරක සභා දහසයකින් යුත් කට්ටලයක් ලෙස නමුත් නව මුහුණුවරකින් මෙම සභා ක්‍රියාත්මක වනු ඇත. අධීක්ෂණ කටයුතු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 යෙන් ලබා දී ඇති බලතල යොදා ගනිමින් මෙම කාරක සභා විසින් අරමුණු හතරක් ඔස්සේ වැඩ කරනු ඇත. එනම්,

(1) ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් පවුල් සහ ප්‍රජාවන්ට සහන ලබා දීම (Relief)
(2) රටටත් රටේ ව්‍යවසායන්ටත් ආර්ථික ප්‍රකෘතිය ළඟා කර දීම (Recovery)
(3) ජනතාව සහ සමස්ත සමාජයම සුවපත් කිරීම (Healing) සහ
(4) එම තුන් වැදෑරුම් ක්‍රියාවලීන්ට සඳහා රාජ්‍ය ආයතන සහ රාජ්‍ය ක්‍රමවේදයන් පුනර්ජීවනය කිරීම (Reinventing government).

### A. ආංශික අධීක්ෂණ කාරක සභා (ආ.අ.කා.ස.) ගණන හා ඒවායේ විෂය පථයන්

අටවැනි පාර්ලිමේන්තුවේ ප්‍රාකාරවම ආංශික අධීක්ෂණ කාරක සභා දහසයක් යෝජනා කෙරේ.

නමුත් අප හමුවේ ඇති දරුණු මෙන්ම දීර්ඝ කාලීන ආර්ථික අර්බුදයට කෙලින්ම සම්බන්ධ කිරීම හා වඩා විශ්ලේෂනාත්මක වර්ගීකරණයක් පදනම් කිරීම අරමුණු කරගෙන අටවැනි පාර්ලිමේන්තුවේ කාරක සභා නාමකරණයට[1] යම් තරමකට වෙනස් වූ නාමකරණ දහසයක් පහත දැක්වේ. වරහන් ඇතුලේ දක්වා ඇත්තේ විශ්ලේෂනාත්මක පදනමක පිහිටුවන ලද ඇමති මණ්ඩලයකින් ආවරණය විය යුතු සමාන්තර ක්ෂේත්‍රයයි.[2] මෙම නාමකරණය පිළිබඳ පැහැදිලි කිරීමක් ඇමුණුම් අංක 1 න් දක්වා ඇත. එක් එක් යෝජිත ආංශික කාරක සභා ක්ෂේත්‍රයන්ට අදාල අනු ක්ෂේත්‍රයන් හා දෙපාර්මේන්තු හා ආයතන ඇමුණුම් අංක 2 න් දක්වා ඇත.

1. **ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම**
   සමාජයේ දුබලම කොටස් වලට අවධානය දෙමින්, පවුල් හා ප්‍රජාවන්ට සහන සැපයීමේ, ප්‍රකෘතිමත් වීමට අත දීමේ, සහ සුවපත් කිරීමේ සේවාවන් (Relief, Recovery & Healing) සාධාරණ හා කාර්යක්ෂමව සැපයීම (පවුල හා ප්‍රජාව)

2. **බලශක්ති සහ ප්‍රවාහනය**
   බලශක්ති ප්‍රභවයන් සහ බලශක්ති භාවිතයන් ප්‍රශස්ත කිරීම (බලශක්ති සහ ප්‍රවාහනය)

3. **ආහාර සුරක්‍ෂිතතාව සහ කෘෂිකර්මය**
   ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ කෘෂිකාර්මික අපනයන ආදායම වැඩි කිරීම සඳහා (කෘෂිකර්මය)

[1] http://www.parliament.lk/files/committees/soc/oversight-plan-8th-parliament-en.pdf
[2] https://www.veriteresearch.org/publication/cabinet-white-paper-sri-lanka/

**4. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා අපනයනය වැඩි කිරීම**
අපගේ විදේශ සංචිත ගොඩනැගීමට සහ දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා (කර්මාන්ත සහ වෙළඳ)

**5. අධ්‍යාපනය**
උපරිම ප්‍රතිලාභ සඳහා සීමිත සම්පත් යොදා ගනිමින් පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දීමට අත්‍යවශ්‍ය නිපුණතා සහිත අනාගත පරපුරක් ගොඩනැගීම සඳහා (අධ්‍යාපනය)

**6. සෞඛ්‍යය**
ආන්තික ආර්ථික තත්ත්වයන් යටතේ ජීවත් වන ජනතාවකගේ අවම සෞඛ්‍ය සහ පෝෂණ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා (සෞඛ්‍යය)

**7. විවෘත සහ වගකියන රාජ්‍ය සේවාවක් සඳහා වූ**
සමස්ත පද්ධති වෙනසක් සඳහා අරගල කරන තරුණයන්ගේ මෙන්ම සමාජයේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා (අභ්‍යන්තර කටයුතු)

**8. ජාත්‍යන්තර සබඳතා**
ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාසය හා ගෞරවය දිනා ගැනීම සඳහා (විදේශ කටයුතු)

**9. ජාතික ආරක්ෂාව**
ජාතික ආරක්ෂාව යළි නිර්වචනය කිරීම සහ ජාතියට සහනය, ප්‍රකෘතිය සහ සුවය ලබා දීම සඳහා අපගේ ආරක්ෂක හමුදාවන්ගේ ශක්තිය උපයෝගී කර ගැනීම සඳහා. (ආරක්ෂාව)

**10. විදේශ රැකියා සහ ශ්‍රමය**
තරුණයින් සඳහා රැකියා පුහුණු හා රැකියා අවස්ථා වැඩි කිරීම සහ සැමට ශ්‍රමයේ ගෞරවය සහතික කිරීම සඳහා (ශ්‍රමය සහ රැකියා)

**11. යුක්තිය සහ නීතිගරුක සමාජයක්**
නීතිය හා සාමය සඳහා වූ ආයතන පිළිබඳව ජනතාවගේ විශ්වාසය ගොඩනැගීම හා නීතිගරුක සමාජයක් ඇතිකිරීම සඳහා (අධිකරණය )

**12. පරිසරය, ස්වභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය**
දුෂ්කර තත්වයන් යටතේ ආර්ථික සංවර්ධනයක් පවත්වා ගැනීමේදී පරිසරයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා. (පරිසරය)

**13. මාධ්‍යය, තාරුණ්‍යය, ජාතික උරුමය සහ නව පුරවැසියා**
ශ්‍රී ලාංකීය උරුමයෙන් ශක්තිමත්ව නව පුරවැසිභාවයක් නිර්වචනය කිරීමට තරුණයින්ට අවකාශයක් නිර්මාණය කිරීම සඳහා (සමාජය සහ සංස්කෘතිය)

**14. සංහිඳියාව සහ ජාතික සමගිය**
බහුවිධ ගැටුම් හා විපත්තිවලින් බැට කෑ සමාජයක් සුවපත් කිරීම අරමුණු කරගනිමින් ආගම් එක් කිරීම සඳහා (සමාජය සහ සංස්කෘතිය)

**15. ළමුන්, කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය**
දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සහ ඔවුන්ගේ සංජානන, ශාරීරික සහ මනෝ සමාජීය සංවර්ධනය; කාන්තාවන් සවිබල ගැන්වීම,;සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ LGBTQ ගැටළු විසඳීම (පවුල සහ ප්‍රජාව)

**16. ජාතික මට්ටමේ ආර්ථික හා භෞතික සැලසුම්කරණය**
රජයේ සහන, ප්‍රකෘතිය සහ සුව කිරීමේ ප්‍රයත්නයන් සඳහා පදනම සැපයීම (මූල්‍ය කටයුතු හා සැලසුම්)

**B. කාර්ය භාරය**

ස්ථාවර නියෝග අංක 111 අනුව එසේම පවතිනු ඇත. එක් එක් ආංශිකය සඳහා විධායක බලතල අදාල අමාත්‍යවරයා සතුවේ.

**C. බලතල**

ස්ථාවර නියෝග අංක 111 අනුව එසේම පවතිනු ඇත.

**D. අවශ්‍ය පහසුකම් හා පරිපාලන හා පර්යේෂණ සහය**

මෙම කාරක සභා ද්වි තල ව්‍යුහයකින් (two-tier structure) ක්‍රියාත්මක විය යුතුය. එනම් එම සෑම කාරක සභාවකම දේශපාලන තලයට දැනුවත්ව හා පමා නොවී තීරණ ගැනීමට සහාය වීම සඳහා පරිපාලන සහ පර්යේෂණ සහාය ලබා දෙන දෙවන තලයක් තිබිය යුතුය. ඒ සඳහා:

**D.1. භෞතික පහසුකම්**

- පාර්ලිමේන්තුව රැස් නොවන දින වල කමිටුවලට රැස් වීම සඳහා පාර්ලිමේන්තුවේම එසේ නැතිනම් ශ්‍රාවස්තිය වැනි තැනක කාරක සභා රැස්වීම් පැවැත්වීම සඳහා පහසුකම්
- මෙම කාමර සඳහා පූර්ණ මාධ්‍ය ආවරණය සඳහා පහසුකම් (මාධ්‍යය හා සන්නිවේදනය පිළිබඳ පස් වැනි නිර්දේශයද බලන්න)
- දැනට පාර්ලිමේන්තුවේ භාවිතයට නොගන්නා වාහන ගාල් කිරීමේ ඉඩ කඩ වහාම මෙම ආංශික අධීක්ෂණ කමිටු වලට නිත්‍ය කාර්යාල හා රැස්වීම් ශාලා ඉදි කිරීම සඳහා යොදා ගන්න.

**D.2. පරිපාලන සහාය**

- සම්බන්ධීකරණය සඳහා අදාල අමාත්‍යංශ වලින් අතිරේක ලේකම් වරුන් එක්කෙනෙකු හෝ දෙදෙනකු වහාම අනුයුක්ත කරන්න.
- ඊට අමතරව පරිපාලන සහාය සඳහා වෙනත් රජයේ ආයතන වලින් නිලධාරීන් අනුයුක්ත කරන්න.

**D.3. පර්යේෂණ හා විශ්ලේෂණ සහාය**

- රජයේ හෝ පුද්ගලික විශ්ව විද්‍යාලවල හෝ පිටරට විශ්ව විද්‍යාලවල උපාධි හෝ පශ්චාත් උපාධි අපේක්ෂකයින් ඉලක්ක කරගනිමින් ආධුනික පුහුණු පදවි ලබා දීම හෝ, විශ්ලේෂණ සහ නිබන්ධන හැකියාව ඇති වෙනත් රාජ්‍ය ආයතන වලින් නිලධාරීන් අනුයුක්ත කර ගැනීම.
- උපදේශකයන් ලෙස ක්‍රියා කර හැකි විශේෂඥයන්ගේ නාමාවලියක් සකස්කරගැනීම (මේ සඳහා ක්‍රියාවලියක් දෙවනුව දැක්වේ.)
- පාර්ලිමේන්තුවට අනුබද්ධව පශ්චාත් ආචාර්ය උපාධි වැඩසටහනක් ඇරඹීම ගැනද සලකා බලන ලෙස යෝජනා කෙරේ. .

**E. මාධ්‍යය හා සන්නිවේදනය**

පාර්ලිමේන්තුවේ කාර්යභාරය හෑල්ලුවට ලක් කරන ව්‍යුහාත්මක හා ආකල්පමය ගැටලු නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් අසාර්ථක බවට ජනමතයක් ගොඩ නැගී ඇත. නමුත් ජනතාවට සහන ලබා දීමට හා ආර්ථිකය යලි නව පණ ගැන්වීමට මන්ත්‍රීවරුන් දැන් වෙහෙස මහන්සි වී වැඩ කිරීමට උනන්දු වන බව මේ රටේ ජනතාව දැන ගැනීම වැදගත්ය.

මෙම පාර්ලිමේන්තු කාරක සභා සඳහා අනුයුක්ත පදනමින් හෝ ස්වේච්ඡා පදනමින් සේවය කිරීම ජාතික සේවාවක් වන අතර එසේ කරන අයට අගනා වෘත්තීය අත්දැකීමක් ද ලබා ගත හැකි බවද සන්නිවේදනය කිරීම වැදගත්ය.

- ආ.අ.කා.ස. රැස්වීම් කාමර හැකි ඉක්මනින් සජීවීව විකාශනය කිරීම සඳහා සම්පූර්ණයෙන් සන්නද්ධ කළ යුතුය
- ආ.අ.කා.ස. හි සභාපතිවරුන් විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන පාර්ලිමේන්තු මාධ්‍ය කාර්යාලය මගින් කඩිනමින් සොයා බලා ප්‍රචාරය කළ යුතුය.

**F. තරුණ නියෝජනය හා එම නියෝජනය සඳහා බඳවා ගැනීමේ පටිපාටිය**

"මන්ත්‍රීවරුන් නොවන කමිටු සමාජිකයින්" ලෙස එක් එක් කමිටුවට වයස 18-35 අතර තරුණ තරුණියන් හතර දෙනෙකු බඳවා ගනිනු ලෙස යෝජනා කෙරේ. .

- මෙම මන්ත්‍රීවරුන් නොවන කමිටු සාමාජිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම හෝ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද භුක්ති විඳීමට නොහැකි බව පැහැදිලි කරමින් බඳවා ගැනීමේ පටිපාටියක් සහ චර්යාධර්ම පද්ධතියක් මහලේකම්වරයා විසින් සැපයිය යුතුය.

- මන්ත්‍රී වරප්‍රසාද අයත් නොවන අන් සෑම ආංශික අධීක්ෂණ ක්‍රියාවලියකටම මෙම මන්ත්‍රීවරුන් නොවන කමිටු සාමාජිකයින්ට සහභාගී විය හැක.
- මන්ත්‍රී-නොවන කමිටු සාමාජිකයින් විසින් ගරු පදනමින් සේවය ලබා දෙන අතර ඔවුන්ගේ සේවා කාලය උපරිම වසර දෙකකට සීමාවේ. ඔවුන්ට ගමන් වියදම් සැපයීම පිළිබඳව සලකා බැලෙනු ඇත.
- රට පුරා විසිරී සිටින තරුණ සාමාජිකයින්ගේ සහභාගීත්වය පහසු කිරීම සඳහා හැකි ඉක්මනින් භෞතික-තත්‍ය ද්විත්ව මාදිලියේ රැස්වීම් සඳහා කමිටු රැස්වීම් කාමරවල පහසුකම් සැලසිය යුතුය.

## G. මන්ත්‍රීවරුන් නොවන තරුණ කමිටු සාමාජිකයින් තෝරා ගැනීම

ඕනෑම ආංශිකයක් සඳහා දැනුම, කුසලතා සහ/හෝ පළපුරුද්ද, සේවය කිරීමට කැපවීම ප්‍රදර්ශනය කිරීම හා අවශ්‍ය ලෙස ඩිජිටල් තාක්ෂණය ඔස්සේ තත්‍ය ලෙස පාර්ලිමේන්තුවට සම්බන්ධ විය හැකි තරුණ තරුණියන්ගෙන් නාමයෝජනා කැඳවීමෙන් මන්ත්‍රී-නොවන සාමාජිකයින් ලෙස සේවය කිරීම සඳහා තරුණ සංචිතයක් පිහිටුවීමට යෝජනා කෙරේ. යොවුන් පාර්ලිමේන්තුවට තමන්ගේම නාමයෝජනා ඉදිරිපත් කිරීමට ආරාධනා කරනු ලැබේ.

අයදුම්පත් 2000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට උත්සාහ කිරීමෙන් පසු, එසේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂා කර, අවශ්‍ය ලෙස පාර්ලිමේන්තු මහලේකම් විසින් නම් කරන වෘත්තීය ආයතනයක සේවය ලබා ගෙන, අයදුම් කරුවන්ගේ කෙටි ලැයිස්තුවක් සකසනු ඇත. එම කෙටි ලැයිස්තුව එක් එක් ආංශිකයට උනන්දුව දක්වන තරුණයින් අවම වශයෙන් 10 දෙනෙකුගෙන් යුක්ත විය යුතු අතර , දිස්ත්‍රික්ක විසි පහේ එක් එක් දිස්ත්‍රික්කයකින් අවම වශයෙන් පදිංචිකරුවන් දෙදෙනෙකු සහ කාන්තාවන් 33% කට නොඅඩු ගණනකින් කෙටි ලැයිස්තුව සමන්විත විය යුතුය.

<u>මන්ත්‍රී-නොවන සාමාජිකයින් තෝරා ගැනීම පාරදෘශ්‍ය කිරීම සඳහා සහභාගීත්ව බඳවා ගැනීමේ ක්‍රමයක් භාවිතා කළ හැක.</u>

උදාහරණයක් ලෙස, යම් ආංශිකයක් සඳහා කැමැත්තක් ප්‍රකාශ කර නැති හෝ එවැනි වෙනත් අයදුම්කරුවෙකු සම්බන්ධයෙන් සබඳතා ගැටුමක් නැති අයදුම්කරුවන් යොදා ගෙන එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවක් සඳහා අයදුම් කරුවන්ගෙන්ම සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සෑදිය හැක. එම මණ්ඩලවල සේවය කිරීම සඳහා එසේ තෝරා ගන්නා අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණ ක්‍රම පිළිබඳ කෙටි පුහුණුවක් ලබා දෙනු ඇති අතර, ඉන් අනතුරුව පාර්ලිමේන්තු මහලේකම්වරයා විසින් නම් කරන ලද අයෙකු විසින් සපයන සම්බන්ධීකරණ පහසුකම් යොදා ගනිමින් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් එක් එක් කාරක සභාව සඳහා මන්ත්‍රීවරුන්-නොවන සාමාජිකයින් හතර දෙනෙකු බැගින් තෝරා ගනු ඇත.

මහලේකම්වරයා විසින් එම මන්ත්‍රීවරුන්-නොවන සාමාජිකයින් සඳහා වන සහභාගිත්ව තෝරා ගැනීමේ ක්‍රමය, බඳවා ගැනීමේ පටිපාටිය සහ වන ආචාර ධර්ම පද්ධතිය තේරීම් කාරක සභාවට පළමුව ඉදිරිපත් කළ යුතුය. බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු, මහලේකම්වරයා විසින් අදාළ සාමාජික නොවන මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තුව තේරීම් කාරක සභාවට ඉදිරිපත් කරනු ඇත.

## H. තරුණ නියෝජනය සඳහා ස්ථාවර කමිටුවක් අවශ්‍ය නොවනු ඇත

පාර්ලිමේන්තු කාරක සභා සඳහා මන්ත්‍රී නොවන තරුණ තරුණියන් තෝරා ගැනීමේ ඉහත දැක්වුණ යම් තරමකට පාරදෘශ්‍ය ක්‍රියාවලිය හෝ ඒ සමාන දෙයක් තේරීම් කාරක සභාවට විසින් පිළිගන්නේ නම්, තරුණ නියෝජනය පිළිබඳ ස්ථාවර කාරක සභාවක් අවශ්‍ය නොවනු ඇතැයි අපි විශ්වාස කරමු.

## I. විශ්ලේෂකයින් හෝ විශේෂඥයින් බඳවා ගැනීම

ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා විශ්ලේෂකයින් හෝ විශේෂඥයන් ලෙස පුද්ගලයන් නම් කිරීම සඳහා විවෘත මාර්ගගත අයදුම් කිරීමේ ක්‍රියාවලියක් හෝ අන්තර්ජාල කවුළුවක් තිබිය යුතුය. මෙහිදී ඕනෑම සුදුසු කම් ඇති රාජ්‍ය නිලධාරියෙකුට විශ්ලේෂකයෙකු ලෙස අයදුම් කිරීමට අවසර දිය යුතුය. රජයේ සේවකයෙකු එසේ අයදුම් කරන්නේ නම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට අන්තර්ජාලය හරහා කැමැත්ත ලබා දීමට හැකියාව තිබිය යුතුය.

නාමයෝජනාද එම අන්තර්ජාල කවුළුවෙන් ලබා දිය හැක. එහිදී එම නම් කරන්නාද මාර්ගගතව එකඟ විය යුතුය. කමිටුවේ සාමාජිකයින්ට ද අන්තර්ජාල ද්වාරය හරහා විශේෂඥයින් නම් කළ හැකිය.

අයදුම් කර ඇති හෝ නම් කර ඇති විශේෂඥයින්ගේ නාම ලේඛනය ඔවුන්ගේ ජීව දත්ත සමග අන්තර්ජාලයේ විවෘතව පවත්වා ගත යුතුය.

අභ්‍යන්තර සාකච්ඡාවකින් පසු එක් එක් කාරක සභාව තමන්ට අවශ්‍ය විශේෂඥයින් එම ලැයිස්තුවෙන් තෝරා ගනු ඇත. විවෘත ලැයිස්තුවේ නැති අය පත් කිරීමට නොහැක.

**J. ව්‍යවස්ථාදායකයේ සේවා දෙපාර්තමේන්තුව තුල පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකයක් පිහිටුවීම සහ අයවැය කාර්යාලයක් පිහිටුවීම**

විවෘත විශේෂඥ ලැයිස්තුව යොදා ගනිමින් ආංශික අධීක්ෂණ කමිටු පිහිටුවීම් ක්‍රියාවලිය සමග මෙම ක්‍රියාවලියද සමාන්තරව සිදු විය හැක. සියලු පත්වීම් අනුයුක්ත කිරීම් හෝ ස්වේච්ඡා පදනමින් කෙරෙනු ඇත.

**K. ආංශික අධීක්ෂණ කමිටු හා අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණය**

ස්ථාවර නියෝග 125 සඳහන් සම්බන්ධීකරණ කමිටුවලට උක්ත සම්බන්ධය කළ හැකිද ප්‍රශ්න සහගතය. අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා, විපක්ෂ නායකවරයා සහ සභානායකවරයාගෙන් සැදුම්ලත් "ආංශික අධීක්ෂණ කමිටු විමර්ශනය සහ ඇගයීම සඳහා වූ කමිටුවක්" මගින් අමාත්‍ය මණ්ඩලය සහ කාරක සභා සභාපතිවරුන් අතර සම්බන්ධීකරණය කළ යුතු යයි යෝජනා කෙරේ.

**L. විමර්ශනය හා ඇගයීම**

යෝජිත කාරක සභා සාර්ථක වනු දැකීම අදාළ සියලු දෙනාගේ ප්‍රාර්ථනය වන බැවින්, ඒවා "විමර්ශනය සහ ඇගයීම සඳහා වූ කමිටුව" වෙත කාලාන්තර ඇගයීම් සිදු කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා විමර්ශන සහ ඇගයීම් (M&E) ඒකකයක් පිහිටුවීම යෝග්‍ය වේ.

මෙම M&E ඒකකය ස්වේච්ඡාවෙන් සේවය සපයන අයගෙන් සමන්විත වියහැක. එසේ වෙතත්, එම ඒකකය සඳහා ශ්‍රාවස්තිය හෝ වෙනත් සුදුසු ස්ථානයක ඉඩක් ලබා දිය යුතුය. කාර්ය මණ්ඩලයක් ද ලබා දිය යුතුයි.

තවද, සියලුම මාධ්‍ය සහ උනන්දුවක් දක්වන සිවිල් සමාජ කණ්ඩායම්වලට ආ.අ.කා.ස. වල ක්‍රියාවලි, ප්‍රතිදාන සහ ප්‍රතිඵල පිළිබඳ තොරතුරු ලබා ගත හැකි විය යුතු අතර එමගින් ඕනෑම උනන්දුවක් දක්වන කණ්ඩායමකට manthri.lk වැනි තමන්ගේම අධීක්ෂණ මෙවලම් සංවර්ධනය කළ හැක. එසේ තොරතුරු ලබා දීම සඳහා අතර ඒ සඳහා M&E නිලධාරියෙකු නම් කළ යුතුය.

**M. මෙම වාර්තාව සඳහා දායකත්වය**

LIRNEasia හි ජ්‍යෙෂ්ඨ පර්යේෂක ආචාර්ය සුජාතා ගමගේ; පාර්ලිමේන්තු අතිරේක මහලේකම් ටිකිරි ජයතිලක මහතා; හිටපු පාර්ලිමේන්තු මහලේකම් ප්‍රියානි විජේසේකර මහත්මිය; සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයේ මහාචාර්ය රොහාන් සමරජීව සහ හරීන්ද්‍ර දිසානායක මහතා; සහ ආචාර්ය ආශු මාරසිංහ, වෛද්‍ය තුසිත විජේමාන්න සහ මලිත් ජයතිලක මහතා යන හිටපු මන්ත්‍රීවරුන් සහ ආ.අ.කා.ස. සභාපතිවරුන්ගේ දායකත්වය කෘතවේදීව සිහිපත් කරනු ලැබේ.

### ඇමුණුම් අංක 1 .යෝජිත ආංශික අධීක්ෂණ කාරක සහා නාමකරණය පිළිබඳ පැහැදිලි කිරීමක්.

අළුතෙන් ආංශික අධීක්ෂණ කමිටු නාමකරණයේදී 2020 දී වෙරිටේ පර්යේෂණ ආයතනය විසින් තාර්කික අමාත්‍ය මණ්ඩලයක්[3] සඳහා යෝජනා කළ අංශ (Sectors) පහළොව පදනම ලෙස යොදා ගත්තෙමු (වගුවේ පළමුවැනි කොලම. Verite-2020).

දෙවනුව අටවැනි පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වූ ආංශික අධීක්ෂණ කමිටු දහසය[4] එම තාර්කික අමාත්‍ය මණ්ඩලයක් සඳහා යෝජිත අංශ 15 ක රාමුවේ පිහිටුවන ලදී. (දෙවැනි කොලම, ආ.අ.කා.ස., 2018).

තුන්වෙනුව, 2018 ආංශික කමිටු ලැයිස්තුවේ නාමකරණයේ සුළු සුළු වෙනස්කම් ඇතිව වත්මන් අර්බුදයට සරිලන ලෙස නැවත නම් කරමින් ඉදිරිපත්කර ඇත (තුන්වැනි කොලම, ආ.අ.කා.ස-2022). උදාහරණ ලෙස සමාජය හා සංස්කෘතිය අංශයේ විෂයයක් වන මාධ්‍ය විෂය, අධිකරණ අංශයෙන්/කමිටුවෙන්, ඉවත් කර අදාල අංශයට යොමු කර ඇත. ශ්‍රමය යන්න සෞඛ්‍යය, මානව සේවා හා සාමාජීය බලගැන්වීම් කමිටුවෙන් ඉවත් කර ශ්‍රමය යන වෙනම අංශයක් නියෝජනය කරන විදේශ රැකියා සහ ශ්‍රමය අංශයකට/කමිටුවකට අනුයුක්ත කර ඇත.

ඉදිරියේදී කමිටු වල සංවිධානයේ හෝ නාමකරණයේ යම් වෙනසක් කරන්නේ නම් නිර්දේශිත මූලික අංශ 15 ක රාමුව තුල වෙනත් සුදුසු රාමුවක් තුල පවතිමින් අංශයන් අනවශ්‍ය ලෙස අනු අංශ ලෙස විභේදනය හෝ අනු අංශ හෝ විෂයයන් නොගැලපෙන ලෙස මිශ්‍ර කිරීම වැලක්වීමට වග බලා ගත යුතුයි.

| Verite-2020අංශ | ආ.අ.කා.ස කමිටු, 2018 | ආ.අ.කා.ස. කමිටු, 2022 (යෝජිත) |
|---|---|---|
| 1. සමාජය හා සංස්කෘතිය | යෞවනය, ක්‍රීඩා, කලා සහ උරුමය | මාධ්‍යය, තාරුණ්‍යය, ජාතික උරුමය සහ නව පුරවැසියා |
| | සංහිඳියාව හා උතුරු නැගෙනහිර නැවත ගොඩ නැගීම | සංහිඳියාව සහ ජාතික සමගිය (ආගමික කටයුතුද ඇතුලත්ව ) |
| 2. පවුල හා ප්‍රජාව | කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය | ළමුන්, කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය |
| | සෞඛ්‍යය, මානව සේවා හා සාමාජීය බලගැන්වීම් | ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම |
| 3. සෞඛ්‍යය | | සෞඛ්‍යය |
| 4. පරිසරය | තිරසාර සංවර්ධනය සහ පරිසරය සහ ස්වභාවික සම්පත් | පරිසරය, ස්වභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය |
| 5. අධ්‍යාපනය හා පර්යේෂණ | අධ්‍යාපනය සහ මානව සම්පත් (HR) සංවර්ධනය | අධ්‍යාපනය |
| 6. ශ්‍රමය | | විදේශ රැකියා සහ ශ්‍රමය |
| 7. කෘෂිකර්මය | කෘෂිකර්මාන්තය සහ ඉඩම් | ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය |
| 8. ආර්ථික කටයුතු | නිෂ්පාදන සහ සේවා; ව්‍යාපාර සහ වාණිජ කටයුතු; | භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා අපනයනය වැඩි කිරීම |
| 9. පොදු උපයෝගිතා-1 | ශක්තිය;<br>ප්‍රවාහන හා සන්නිවේදනය | බලශක්ති සහ ප්‍රවාහනය |
| පොදු උපයෝගිතා-2 | ආර්ථික සංවර්ධනය | ආර්ථික හා භෞතික සැලසුම්කරණය[5] |
| 10. වරාය, නාවික හා ගුවන් සේවා | | |
| 11. මුදල් කටයුතු හා සැලසුම් | | |
| 12. ස්වදේශීය කටයුතු හා රාජ්‍ය පරිපාලනය | අභ්‍යන්තර පරිපාලනය සහ රාජ්‍ය කළමනාකරණය | විවෘත සහ වගකියන රාජ්‍ය සේවාවක් |
| 13. අධිකරණය | නීති කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය | යුක්තිය පසිඳලන සහ නීතිගරුක සමාජයක් |
| 14. ආරක්ෂාව | ජාතික ආරක්ෂාව | ජාතික ආරක්ෂාව |
| 15. විදෙස් කටයුතු | ජාත්‍යන්තර සබඳතා | ජාත්‍යන්තර සබඳතා |

[3] https://www.veriteresearch.org/wp-content/uploads/2020/08/VR-White-Paper_A-Rational-Method-for-Cabinet-Formation-in-Sri-Lanka_August-2020.pdf

[4] [4] http://www.parliament.lk/files/committees/soc/oversight-plan-8th-parliament-en.pdf

[5] මෙයට සන්නිවේදනය, ජල සම්පාදනය, නාගරික සංවර්ධනය හා නිවාස යන පොදු උපයෝගිතා විෂයයන් අයත් වේ. (බලශක්ති හා ප්‍රවාහනය යන පොදු උපයෝගිතා විෂයයන් කාලීන අවශ්‍යතාවය අනුව වෙනම කමිටුවක් ලෙස පවත්වාගැනීමට යෝජනා කර ඇත.

## ඇමුණුම අංක 2. යෝජිත අංශ, අනු අංශ/විෂයයන් හා අනුයුක්ත දෙපාර්තමේන්තු හා ආයතන

මෙහි දක්වා ඇති අනු අංශ/විෂයයන් හා අනුයුක්ත දෙපාර්මේන්තු හා ආයතන ලැයිස්තුව 2018 පලවුණු "ආංශික අධීක්ෂණ කමිටුව වල සැලසුම්"[6] යන වාර්තාවෙන් උපුටා ගන්නා ලදී. සුළු වෙනස් කම් ඇතිනම් ඒවා පිටු අග සටහනක් ලෙස දක්වා ඇත. පාර්ලිමේන්තුවේ ප්‍රධාන ලේකම් විසින් පක්ෂ නායකයින් සමග සාකච්ඡාවෙන් අවශ්‍ය ලෙස වෙනස් කම් සිදු කරනු ඇත.

| යෝජිත නව අංශ | අනු අංශ/විෂයයන් 2018 | අනුයුක්ත දෙපාර්තමේන්තු හා ආයතන 2018 |
|---|---|---|
| Alleviating the Impact of the Economic Crisis<br><br>ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම | Social Empowerment & welfare | 1. Department of Social Services 2. National Secretariat for Elders and National Council for Elders 3. National Secretariat for Persons with Disabilities 4. National Council for Persons with Disabilities 5.National Institute of Social Development 6.Department of Divineguma Development 7.Rural Development Training and Research Institute 8. Social Security Board |
| | Cooperatives and Government Distribution Networks[7] | 5. Lanka Sathosa Ltd. 6. Lanka General Trading Company Ltd. 7. Co-operative Wholesale Establishment 9. Department of Food Commissioner 10. Department of Cooperative Development (Registrar of Co-operative Societies) 11. Co-operative Employees Commission 12. Internal Trade Department 13. National Institute of Cooperative Development |
| | Hill Country Development | 1. Rural Community Development (Youth Empowerment) Project 2. Estate Sector Self-employment Revolving Fund 3. Plantation Housing Development Trust 4. Saumyamoorthi Thondaman Memorial Foundation |
| Energy & transport<br><br>බලශක්ති සහ ප්‍රවාහනය | Power and Renewable Energy | 1. Ceylon Electricity Board and its subsidiary Companies 2. Lanka Electricity Company 3. Lanka Coal Company (Pvt.) Ltd. 4. LTL Holdings (Pvt.) Ltd. 5. Sri Lanka Sustainable Energy Authority 6. Sri Lanka Atomic Energy Board 7. Sri Lanka Atomic Energy Regulatory Council |
| | Petroleum Resources Development | 1. Ceylon Petroleum Corporation 2. Ceylon Petroleum Storage Terminal Ltd. 3. Petroleum Resources Development Secretariat 4. Polipto Lanka (Pvt.) Ltd. |
| | Highways | 1. Road Development Authority and its Subsidiaries and Associates 2. Road Maintenance Trust Fund |
| | Transport | 1. Department of Sri Lanka Railways 2. Sri Lanka Central Transport Board 3. National Transport Medical Institute 4. Department of Motor Traffic 5. National Transport Commission 6. Civil Aviation Authority 7. Airport and Aviation Services (Sri Lanka) Ltd. |
| Food Security & Agriculture<br><br>ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය | Agriculture | 1. Department of Agriculture 2. Department of Agrarian Development 3. National Fertilizer Secretariat 4. Agriculture and Agrarian Insurance Board 5. National Agricultural Diversification and Settlement Authority (Hadabima) 6. Sri Lanka National Freedom from Hunger Campaign Board 7. Pulses and Grain Research and Production Authority 8. Hector Kobbekaduwa Agrarian Research and Training Institute 9. Sri Lanka Council for Agricultural Research Policy 10. Institute of Post-Harvest Technology 11. Ceylon Fertilizer Company Ltd. 12. Colombo Commercial Fertilizer Company 13. Janatha Fertilizer Enterprises Ltd. 14. Lanka Phosphate Company Ltd. |
| | Fisheries and Aquatic Resources Development | 1.Department of Fisheries and Aquatic Resources 2. National aquaculture Development Authority 3.Ceylon Fishery Harbours Corporation 4. Cey-Nor Foundation Ltd. 5. Ceylon Fisheries Corporation 6.National Aquatic Resources Research and Development Agency |
| | Irrigation and Water Resources Management | 1. Department of Irrigation 2. Water Resources Board 3. Riverine Bamboo Project |
| | Lands | 1. Department of Land Commissioner General 2. Land Reform Commission 3. Department of Land Settlement 4. Department of Surveyor General 5. Institute of Surveying and Mapping 6. Land Survey Council 7. Department of Land Use Policy Planning 8. Kantalai Sugar Company |
| | Mahaweli Development | 1. Mahaweli Authority of Sri Lanka (except Mahaweli Livestock Enterprise Company Ltd.) 2. Moragahakanda and Kalu Ganga Reservoir Project 3. Dam Safety & Water Resources Planning Project 4.Mahaweli Consolidation Project (System B rehabilitation) 5.Udawalawe Left Bank Project 6.Uma Oya Development Project 7. Central Engineering Consultancy Bureau and its subsidiary companies and associates |
| | Regional Development | 1. National Agricultural Diversification and settlement Authority (Hadabima Authority) |
| | Animal Husbandry & | 1. Rural Resuscitation Fund 2. Rural Economic Re suscitation Fund (Finance) 3. Janadiriya Fund (Gramodaya Mandala Fund) 4. Department of Animal Production and Health 5. National Livestock Development Board and associated companies 6. Kiriya Milk Industries Lanka (Pvt.) |

[6] http://www.parliament.lk/files/committees/soc/oversight-plan-8th-parliament-en.pdf

[7] Cooperatives and Government Distribution Networks is a has been moved to the Alleviating Impact Committee/Sector from the Commerce sub-sector

| | | |
|---|---|---|
| | Rural Economic Affairs | Ltd. 7. Milk Industries Lanka Ltd. 8. Mahaweli Livestock Enterprises Ltd. 9. Paddy Marketing Board 10. Regional Economic Centers |
| 08. Increasing Export of Goods & Services<br><br>සේවා සහ භාණ්ඩ අපනයන හා නිෂ්පාදනය වැඩ කිරීම | Commerce | 1. Department of Commerce 2. Registrar of Companies 3. National Intellectual Property Office of Sri Lanka 4. Consumer Affairs Authority 8. Department of Measurement Units, Standards and Services 14. National Handicrafts Board (Laksala) |
| | Industry | 1.Industrial Development Board 2. Sri Lanka Institute of Textile and Apparels 3. Department of Textile Industries 4. Kahatagaha Graphite 5. Lanka Leyland Ltd. 6. Lanka Ashok Leyland Ltd. 7. Lanka Cement Ltd. 8. Sri Lanka Cement Corporation 9. Manthai Salt Ltd. 10. Elephant Pass Saltern 11. Lanka Textile Mills Emporium Ltd. 12. Lanka Salusala Ltd 13. National Enterprise Development Authority 14. National Crafts Council 15.National Design Centre 16.SME Venture Capital Company 17. SME Authority 18. Hingurana Sugar Industry Ltd. 19. Ceylon Sugar (Pvt.) Ltd. 20. National Paper Corporation Ltd. 21. Lanka Mineral Sands Company 22. Paranthan Chemicals Ltd. |
| | Plantation Industries | 1. Department of Rubber Development 2. National Institute of Plantation Management 3. Sri Lanka Tea Board 4. Tea Small Holdings Development Authority 5. Tea and Rubber Estates (Control and Fragmentation) Board 6. Tea Shakthi Fund 7. Thurusaviya Fund 8. Tea Research Institute 9. Rubber Research Institute 10. Coconut Cultivation Board 11. Coconut Development Authority 12. Coconut Research Institute 13. Sugarcane Research Institute 14. Kalubovitiyana Tea Factory Ltd. 15. Sri Lanka Rubber Manufacturing and Export Corporation |
| Education<br><br>අධ්‍යාපනය | School Education | 1.Department of Examinations 2. Department of Educational Publications 3.National Institute of Education 4.Sri Lanka Publication Development Bureau 5.National Library and Documentation Services Board 6.Directorates of Education 7.National Authority on Teachers Education 8.Colleges of Education 9. Teachers' Colleges 10. UNESCO National Commission of Sri Lanka 11. Piriven Education Board * For other Institutions, see under Sectoral Oversight Committee on Youth, Sports, Arts and Heritage |
| | Higher Education | 1.University Grants Commission 2. All Universities under the purview of University Grants Commission 3.All Postgraduate Institutions and other Institutions under the purview of the University Grants Commission 4. Buddha Sravaka Bhiksu University 5. Buddhist and Pali University 6. Sri Lanka Institute of Information Technology (SLIIT) and all information technology centres affiliated to SLIIT 7. Sri Lanka Institute of Advanced Technological Education |
| | Labour and Trade Unions Relations | 1.Department of Labour 2. National Institute of Labour Studies 3. Employees' Provident Fund 4.National Institute for Occupational Safety and Health 5.Office of the Commissioner of Workmen's Compensation 6.Shrama Vasana Fund 7.Department of Manpower and Employment 8.Sri Lanka Job Net Ltd. |
| | Science, Technology and Research | 1.Sri Lanka Institute of Nanotechnology (Pvt.) Ltd. 2. National Institute of Fundamental Studies 3.National Science Foundation 4.National Science and Technology Commission 5. Planetarium 6. Arthur C. Clarke Centre for Modern Technology 7.Sri Lanka Accreditation Board for Conformity Assessment 8. Sri Lanka Standard Institute 9. Sri Lanka Inventors' Commission 10. Inventors' Fund 11. National Engineering Research & Development Centre 12. National Research Council 13. Industrial Technology Institute |
| | Skills Development and Vocational Training | 1.Tertiary and Vocational Education Commission 2.Vocational Training Authority of Sri Lanka 3.National Apprenticeship and Industrial Training Authority 4.Skills Development Fund Ltd. 5.Ceylon German Technical Training Institute 6.National Institute of Business Management and affiliated Institutions 7.University of Vocational Technology 8.Sri Lanka Institute of Printing 9.National Institute of Fisheries and Nautical Engineering 10.National Institute of Technical Education 11.Department of Technical Education and Training |
| Health<br><br>සෞඛ්‍යය | Health, Nutrition, and Indigenous Medicine | 1. Department of Health Services 2. Sri Jayewardenepura General Hospital 3. Vijaya Kumaranatunga Memorial Hospital 4. State Pharmaceutical Corporation 5. State Pharmaceutical Manufacturing Corporation 6. All National, Teaching and Specified Government Hospitals 7. National Health Council 8. Medical Research Institute 9. National Institute of Health Science 10. Ashraff Memorial Hospital 11. School of Medical Laboratory Technology 12. Sri Lanka Medical Council 13. Sri Lanka Medical College Council 14. National Health Development Fund 15. Private Medical Institute Council 16. National Institute of Nephrology, Dialysis and Transplantation 17. Sri Lanka Thriposha Ltd. 18. National Authority on Tobacco and Alcohol 19. Department of Ayurveda 20. Sri Lanka Ayurvedic Drugs Corporation 21. Ayurvedic Medical Council 22. Ayurvedic College and Hospital Board 23. Ayurveda Teaching Hospitals 24. Homeopathy Hospital, Welisara 25. Homeopathy Medical Council |
| An Open & accountable Government | Home Affairs | 1. All District Secretariats 2. All Divisional Secretariats 3. Department of Registrar General |
| | Internal Affairs | 1. Department of Immigration and Emigration 2. Department of Registration of Persons |
| | Provincial Councils and | 1.Sri Lanka Institute of Local Government 2. Local Loans and Development Fund |

| | | |
|---|---|---|
| විවෘත හා වගවෙන ආණ්ඩුවක් | Local Government | |
| | Public Administration and Management | 1. Sri Lanka Institute of Development Administration 2. Distance Learning Centre Ltd. 3. Department of Pensions 4. Public Service Pensioners' Trust Fund 5. Productivity Secretariat |
| | Post, Postal Services | 1. Postal Department |
| | Law & Order | 1.Department of Police 2. National Dangerous Drugs Control Board |
| International Relations<br><br>ජාත්‍යන්තර සබඳතා | Foreign Affairs | 1.Diplomatic Missions Abroad 2. Lakshman Kadirgamar Institute for International Relations and Strategic Studies 3. National Oceanic Affairs Committee Secretariat |
| National Security<br><br>ජාතික ආරක්ෂාව | Defense | 1. Sri Lanka Army 2. Sri Lanka Navy 3. Sri Lanka Air Force 4.Department of Civil Security 5.Sir John Kotelawala Defense University 6.Defence Services Command and Staff College 7.Ranaviru Seva Authority 8.Defence Services School 9. National Cadet Corps 10. National Defence Fund 11.State Intelligence Service 12.Coast Guard Department of Sri Lanka 13.Lanka Logistics Limited 14.Rakna Arakshana Lanka Ltd. |
| Labor & Foreign Employment<br><br>ශ්‍රමය හා විදෙස් රැකියා | Labor and Trade Unions Relations | 1.Department of Labour 2. National Institute of Labour Studies 3. Employees' Provident Fund 4.National Institute for Occupational Safety and Health 5.Office of the Commissioner of Workmen's Compensation 6.Shrama Vasana Fund 7.Department of Manpower and Employment 8.Sri Lanka Job Net Ltd. |
| | Foreign Employment | 1. Sri Lanka Bureau of Foreign Employment 2. Sri Lanka Foreign Employment Agency |
| Justice and a Law- Abiding Society<br><br>යුක්තිය පසිඳලන සහ නීතිගරුක සමාජයක් | Justice | 1. Attorney General's Department 2. Legal Draftsman's Department 3. Department of Debt Conciliation Board 4. Department of Government Analyst 5. Office of the Registrar of the Supreme Court 6. Law Commission of Sri Lanka 7. Superior Courts Complex Board of Management 8. Legal Aid Commission of Sri Lanka 9. Mediation Boards Commission 10. Council of Legal Education 11. Department of Public Trustee 12. Office of the Secretariat of Labour Tribunals 13. Training Institute for Non Judicial Officers 14. Quazi Courts and Quazis Board of Appeal 15. Sri Lanka Judges' Institute 16. Authority for Protection of Victims and Witnesses |
| | Prison Reforms | 1.Department of Prisons 2. Community Based Correction Department 3. Training Schools for Youthful Offenders |
| Environment, Natural resources & Sustainable Development<br><br>පරිසරය, ස්වභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය | Environment | 1.Department of Forests 2. Central Environmental Authority 3.Geological Survey and Mines Bureau 4.GSMB Technical Servics (Pvt) Ltd. 5.State Timber Corporation 6.National Gem and Jewellery Authority 7.Gem and Jewellery Research Institute 8.Lanka Timber Plant and Industries 9.Marine Environment Protection Authority 10.Department of Coast Conservation |
| | Sustainable Development and Wildlife | 1. Department of National Zoological Gardens 2. Department of National Botanical Gardens 3. Department of Wildlife Conservation 4. Wildlife Trust |
| Media, Youth, Heritage, and New Citizen<br><br>මාධ්‍යය, තාරුණ්‍ය, උරුමය හා නව පුරවැසියා | Information & media | 1. Department of Information 2. Department of Government Printing 3. Sri Lanka Press Council 4. Sri Lanka Broadcasting Corporation 5. Sri Lanka Rupavahini Corporation 6. Independent Television Network 7. State Printing Corporation 8. Associated Newspapers of Ceylon Ltd. 9. Lanka Puwath Ltd. 10. Selacine Rupavahini Institute 11. Creative Helanka Ltd. 12. National Film Corporation 13. Sri Lanka Television Training Institute 14. Mahinda Rajapaksa |
| | Culture & Heritage | 1.Department of Cultural Affairs 2. Department of National Museum 1. Department of Archaeology 2.Tower Hall Theatre Foundation 3. Public Performance Board 4. National Performing Arts Centre 5. National Arts Council 6. Gramodaya Folk Arts Centre 7. Ape Gama 8. Department of National Archives 9. Central Cultural Fund 1. Galle Heritage Foundation |
| | Sports | 1. Department of Sports development 2. Sugathadasa National Sports Complex Authority 3. National Institute of Sports Science 4. National Sports Council 5. Institute of Sports Medicine 6. Sri Lanka Anti-doping Agency |
| | Youth Affairs | 1.National Youth Services Council 2. National Youth Corps 3.National Youth Awards Authority 4.National Youth Services Co-operative Limited 5.National Centre for Leadership Development |
| | Rehabilitation & Resettlement | 1. Resettlement Authority 2. Rehabilitation of Persons, Properties and Industries Authority 3. Commissioner General of Rehabilitation 4. Palmyrah Development Board 5. North Sea Ltd. |

| | | |
|---|---|---|
| Reconciliation and National Unity<br><br>සංහිදියාව හා ජාතික සමගිය | National Co-existence, Dialogue | 1. Department of Official Languages 2. Official Languages Commission 3. National Institute of Language Education and Training 4. Secretariat for Non-Governmental Organizations |
| | National Reconciliation | 1. Office for National Unity and Reconciliation Entrusted with Implementing the Mandate of the Ministry |
| | Religious Affairs | Dept of Buddhist Affairs 2. Buddha Sasana Fund 3. International Buddhist Centre<br>Department of Christian Cultural Affairs<br>Department of Hindu Religious and Cultural Affairs<br>Department of Muslim Religious and Cultural Affairs |
| Children, Women, and Gender<br><br>දරුවන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂ Sසමාජභාවය | Women & Gender | 1. Sri Lanka Women's Bureau 2. National Committee on Women |
| | Child Affairs | 3.Department of Probation and Childcare Services 4. National Child Protection Authority 5. Children's Secretariat |
| 01. National Economic and Physical Planning<br><br>ජාතික මට්ටමේ ආර්ථික හා භෞතික සැලසුම්කරණය | National Polices and Economic Affairs | 1. Department of National Planning 2. Central Bank of Sri Lanka 3. Department of External Resources 4. Department of Census and Statistics 5. Institute of Policy Studies 6. National Operations Room 7. Department of Project Management and Monitoring 8. Securities and Exchange Commission of Sri Lanka 9. Credit Information Bureau 10. National Pay Commission 11. National Insurance Trust Fund 12. Strike, Riot and Civil Commotion and Terrorism Fund 13. Employees' Trust Fund 14. Public Utilities Commission of Sri Lanka 15. National Human Resources Development Council |
| | Foreign Investments and International Trade | 1. Board of Investment of Sri Lanka 2. Sri Lanka Export Development Board 3. Department of Import and Export 4. Mahapola Higher Education Scholarship Trust Fund |
| | Physical Planning & Development | 1. Urban Development Authority 2. Sri Lanka Land Reclamation and Development Corporation 3. National Physical Planning Department |
| | City Planning & & Water Supply | 1. National Water Supply and Drainage Board (NWS&DB) 2. Department of National Community Water Supply |
| | Disaster Management | 1. National Disaster Management Council 2. Disaster Management Centre 3. National Disaster Relief Services Centre 4. Department of Meteorology 5.National Building Research Organization |
| | Housing and Construction | 1. The Urban Settlement Development Authority 2. National Housing Development Authority 3. Condominium Management Authority (Common Amenities Board) 4. Centre for Housing Planning and Building 5. Building Materials Corporation 6. Department of Buildings 7. Government Factory 8. Construction Industry Development Authority 9. State Engineering Corporation 10. State Development and Construction Corporation 11. Devco Showa (Pvt.) Ltd. 12. National Equipment and Machinery Organization |
| | Ports and Shipping | 1. Sri Lanka Ports Authority and its Subsidiaries and Associates 2. Ceylon Shipping Corporation Ltd and its Subsidiaries and Associates 3. Merchant Shipping Secretariat 4. Shipping & Aviation Information and Research (Pvt) Ltd |
| | Telecommunication and Digital Infrastructure | 1. Information and Communication Technology Agency2. Sri Lanka Telecom Ltd, and its subsidiaries and associates 3. Department of Telecommunication (under liquidation) 4. All Information Technology Parks regard to the subjects of telecommunication |
| | Public Enterprise Development | 1. Bogala Graphite Lanka Ltd. 2. Ceylon Ceramics Corporation (Brick and Tiles) Division 3. Kahagolle Engineering Services Company Ltd. (KESCO) 4. BCC Limited 5. Public Resources Management Corporation 6. Hotel Developers (Lanka) PLC (PQ 143) 7. Sri Lankan Air Line Ltd. and its subsidiaries 8. Mihin Lanka (Pvt.) Ltd. 9. Insurance Corporation of Sri Lanka and its subsidiaries and associated companies 10. All state Banks and its subsidiaries and associated companies 11. Lakdiva Engineering Ltd. 12. Werahara Engineering Services Ltd. (WESCO) 13. Janatha Estate Development Board 14. Sri Lanka State Plantation Corporation 15. Elkaduwa Plantation Company Ltd. 16. Kurunegala Plantation Company Ltd. 17. Chilaw Plantation Company Ltd. 18. Galoya Plantation (Pvt.) Company 19. Sri Lanka Cashew Corporation |
| | Tourism Development | 1.Sri Lanka Tourism Promotion Bureau 2. Sri Lanka Tourism Development Authority 3. Sri Lanka Exhibition and Convention Bureau 4.Sri Lanka Institute of Tourism and Hotel Management |